# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

# තනතුරු පුරප්පාඩු

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පහත තනතුරු සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

1\. **තනතුර** : **පර්යේෂණ විශ්ලේෂක (පුරප්පාඩු 01)**

**මාසික දීමනාව** : **මූලික වැටුප - රු.46,406/-+ ජීවන වියදම් දීමනාව - රු.7,800/- = රු.54,206/-**

**සුදුසුකම්** : **අධ්‍යාපන සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ආරක්ෂක අධ්‍යයනය/බුද්ධි සේවා අධ්‍යයනය/ත්‍රස්තවාදය/සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

**පළපුරුද්ද**

පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් සහිත වීම.

**වයස** : අවු. 21 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි.

**බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2\. **තනතුර** : **පර්යේෂණ සහකාර (පුරප්පාඩු 04)**

**මාසික දීමනාව** : **මූලික වැටුප - රු.22,240/-+ ජීවන වියදම් දීමනාව - රු.7,800/- = රු.30,040/-**

**සුදුසුකම්** : **අධ්‍යාපන සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ආරක්ෂක අධ්‍යයනය/බුද්ධි සේවා අධ්‍යයනය/ත්‍රස්තවාදය/සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද**

පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් සහිත වීම.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි.

**බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

ඉහත තනතුරුවලට අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත් 2019.04.01 දිනට හෝ ඊට ප්‍රථම **ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

වැඩිදුර විස්තර සඳහා www.defence.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**